# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම - 2025
## කතෝලික ධර්මය

**විභාග අංකය:..................................................**

| 7 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය 02 |
|---|---|---|

1 කොටස

**වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. ඉශ්‍රායෙල් දේශක දිවැසිවරුන් වන්නේ,
    1. යෙසායා, ජෙරමියා, එසකියෙල්  2. සාමුවෙල්, එලියා, එලීෂා
    3. නාතාන්, එලීෂා, එලියා  4. දානියෙල්, මීකා, හුල්දා

02. දිවැසිවරයා හැඳින්වීමට "ප්‍රොෆෙටෙස් " යන වචනය භාවිතා කරන්නේ,
    1. හෙබ්‍රෙව් භාෂාවෙන්ය  2. ග්‍රීක භාෂාවෙන්ය
    3. ලතින් භාෂාවෙන්ය  4. ඇරමයික් භාෂාවෙන්ය

03. ජෙරමියා දිවැසිවරයාගේ නාමේ අර්ථය වන්නේ ,
    1. දෙවියන් වහන්සේ ආලේප කළ සේක  2. දෙවියන් වහන්සේ ශක්තිමත් කරන සේක
    3. දෙවියන් වහන්සේ ගලවන සේක  4. දෙවියන් වහන්සේ උසස් කළ සේක

04. තම විවාහ ජීවිතයම එක්තරා ආකාරයක දිවැසිවර පණිවුඩයක් කරගනිමින් දිවැසිවර කාර්‍යය ඉටු කළේ,
    1. ආමොස්  2. ජෝනා  3. හොසියා  4. මලාකි

05. "පොරොන්දු දේශය" යනුවෙන් හඳුන්වන්නේ,
    1. ඌර්  2. කානාන්  3. හාරාන්  4. ජෙරුසලම

06. දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමාගේ පෙළපතට ලබාදුන් දේශය, ඊට පෙර අයිතිව තිබුණේ,
    1. හිත්තිවරුන්ට  2. කල්දිවරුන්ට  3. අමෝරිවරුන්ට  4. කානානිවරුන්ට

07. යුප්‍රටීස් හා ටයිග්‍රීස් ගංගා දෙක අතර පිහිටි ප්‍රදේශය හඳුන්වන නම වන්නේ,
    1. බබිලෝනිය  2. අසිරියාව  3. හාරාන්  4. මිසරය

08. 'මොරියා' දේශයේ සිදුවූ වැදගත් සිදුවීමක් වන්නේ,
    1. චර්මඡේදන පිළිවෙත අනුමත කිරීම  2. නෝවාගේ ජල ගැල්ම
    3. ඊසාක්ව දවන යාගයක් ලෙස ඔප්පු කිරීම  4. ජාකොබ්ගේ සහ ඒසව්ගේ උපත

09. ජාකොබ්තුමා "දෙවියන් වහන්සේගේ ගෘහය " ලෙස නම් කළ ස්ථානය වන්නේ,
    1. බෙයර්ෂෙබා  2. හාරාන්  3. ජෙරුසලම  4. බෙතෙල්

10. ජුදස්ගේ මරණයෙන් පසුව ඔහු වෙනුවට තෝරා පත් කරගත් අපෝස්තුලුවරයා වන්නේ,
    1. ශුද්ධවූ ජුවාම් මුනිතුමා  2. ශුද්ධවූ මතියස් මුනිතුමා
    3. ශුද්ධවූ ස්තේපන් මුනිතුමා  4. ශුද්ධවූ පාවුලු මුනිතුමා

- 11 සහ 12 ප්‍රශ්න සඳහා අදාළ වේ.

A - ප්‍රසාද ස්නාපනය B - පූජකවරය C - අභිවෘද්ධි ආලේපය D - දිව්‍ය සත්ප්‍රසාදය

11. ක්‍රිස්තුන් වහන්සේ විසින් තම අපෝස්තුලුවරුන්ට පවරන ලද ධර්මදූත සේවාව ඉදිරියට ගෙන යනු ලබන්නේ,
 1. A 2. B 3. C 4. D

12. පූජාප්‍රසාදිවරයෙකු, දිවැසිවරයෙකු හා රජ කෙනෙකු ලෙස ක්‍රියා කිරීමට තුන් ආකාර කැඳවීමක් ලැබෙන්නේ,
 1. A 2. B 3. C 4. D

13. පැවිදි ජීවිත ගත කරන අයගේ ප්‍රධාන කාර්යය වන්නේ,
 1. වේදහාර පිළිපැදීම 2. මීසම් සේවයේ යෙදීම
 3. දේව රාජ්‍යය ගොඩනැගීම 4. නිකායේ දූතික සේවා වල යෙදීම

14. එකිනෙකා වෙනුවෙන් යාච්ඤා කිරීම, පොදු පූජකවරය මගින් ඔබට ලැබෙන ..................කාර්යයකි.
 1. රාජකීය 2. දිවැසිවර 3. එඬේරික 4. පූජක

15. කිතුනු විවාහයේ ලක්ෂණ ලෙස සලකන්නේ,
 1. ඒකත්වය හා ශුද්ධත්වය 2. අඛණ්ඩභාවය හා ඒකත්වය
 3. ශුද්ධත්වය හා ආදරය 4. සාධරණත්වය හා අඛණ්ඩභාවය

16. දූතික සේවා අතරින් තරුණියන් සඳහා විවිධ සේවා, පාසල් අධ්‍යාපනය, අනාථ වූ තරුණියන්ගේ ජීවිත ගොඩනැගීම සිදුකරන පැවිදි නිකාය වනුයේ,
 1. ශුද්ධවූ පවුලේ නිකායේ පැවිදි සොයුරියන් 2. තෙරේසා මව්තුමියගේ නිකායේ පැවිදි සොයුරියන්
 3. යහපත් එඬේරාගේ පැවිදි සොයුරියන් 4. සිරි කුරුස පැවිදි සොයුරියන්

17. බොරු කීමෙන් මරණයට පත්වූ යුවලක් ලෙස ශුද්ධවූ බයිබලයේ නව ගිවිසුමේ සඳහන් වන්නේ,
 1. ලොත් සහ ලොත්ගේ භාර්යාව 2. ආදම් හා ඒව
 3. අනනියස් හා සපීරා 4. හෙරෝද් හා හෙරෝදියස්

18. පූජකවරයෙහි ධූරාවලියන් තුන වන්නේ,
 1. පැවිදි පූජක, පදවි පූජක, රදගුරු 2. රාජකීය, පූජක, දිවැසිවර
 3. ගිහි, පැවිදි, පූජක 4. තේවාචාරී, පූජක, රදගුරු

19. කිතුනු පවුලේ ආදර්ශය,
 1. සාන්ත සභාව 2. මීසම් පවුල 3. ශුද්ධවූ පවුල 4. ශුද්ධවූ ත්‍රිත්වය

20. දෙමාපියන්, පාසල හා රට වෙනුවෙන් යුතුකම් ඉටු කිරීමට අපව යොමු කරන දේව පණත වනුයේ,
 1. 4 2. 5 3. 6 4. 7

## II කොටස

- පළමු ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

1. I.සුළු දිවැසිවරු දෙදෙනෙක් නම් කරන්න.

II.ආමොස් දිවැසිවරයාව හඳුන්වන වෙනත් නමක් ලියන්න.

III.ආබ්‍රහම් තුමාට පරිත්‍යාග කිරීමට සිදුවූ දේවල් දෙකක් ලියන්න.

IV.ජාකොබ්තුමාගේ දෙමව්පියන් නම් කරන්න.

V.පූජා ප්‍රසාදි තුමන්ලාගේ වගකීම් දෙකක් ලියන්න.

VI.පදවි පූජකවරු ගන්නා පොරොන්දු දෙක මොනවාද?

VII.දස පනතේ හතරවන පනත කුමක්ද?

VIII.යෙසායා යන නමෙහි අර්ථය ලියන්න.

IX.දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමා සමග ඇති කරගත් ගිවිසුමේ බාහිර සලකුණ කුමක්ද?

X.ජේසුස් වහන්සේගේ ප්‍රථම ශ්‍රාවකයින් දෙදෙනෙක් නම් කරන්න. (2×10+10)

2.I.දිවැසිවරයා යන්නෙහි අර්ථය කුමක්ද?

II.දේව හඬ අප වෙත පැමිණෙන ආකාර 3 ක් ලියන්න.

III.දිවැසිවරයෙකු ලෙස ඔබට කල හැකි කාර්යයන් 5 ක් ලියන්න. (2+3+5)

3.I.ආබ්‍රහම් තුමා විශ්වාසයේ පියා ලෙස හඳුන්වන්නේ ඇයි?

II.ආබ්‍රහම් තුමාගේ කැඳවීම තුළින් ඔබට ගත හැකි ආදර්ශ 3 ක් ලියන්න.

III.ඔබ තුළ වර්ධනය කරගත යුතු නායකත්වයේ ගුණාංග 5 ක් ලියන්න. (2+3+5)

4.I.ඊසාක් යන නමෙහි අර්ථය ලියන්න.

II.ඊසාක් තුමාගේ ජීවිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ 3 ක් ලියන්න.

III.කිතුණු දරුවකු ලෙස දෙමාපියන් වෙනුවෙන් ඔබ ඉටුකරන යුතුකම් 5 ක් ලියන්න. (2+3+5)

5.I.දිව්‍ය සංරක්ෂණය යන්නෙහි යන්නෙන් කුමක් අදහස් වේද?

II.එළියා දිවැසිවරයා දිව්‍ය සංරක්ෂණය අත්දුටු අවස්ථාව කෙටියෙන් විස්තර කරන්න.

III.ඔබට දෙවි පියාණන්ගේ රැකවරණය පතා යාඥාවක් නිර්මාණය කරන්න. (2+3+5)

6.I.ප්‍රසාද ස්නාපනයේදී අත්‍යාවශ්‍ය හා අනිවාර්ය පිළිවෙත කුමක්ද?

II.ප්‍රසාද ස්නාපන පොරොන්දු දෙකක් ලියන්න.

III.පූජක හා පැවිදි වරුන්ගේ සේවාවන්ට ඔබට සහාය විය හැකි ආකාර 5 ක් ලියන්න. (2+3+5)

7.I.අටවන දේව පනත ලියන්න.

II.දේව පනත් පිළිපැදීමේ ප්‍රයෝජන 3 ක් ලියන්න.

III.ඔබේ ආත්මික ජීවිතය වර්ධනය කර ගැනීම සඳහා ඔබ ගන්නා ක්‍රියාමාර්ග 5 ක් ලියන්නග (2+3+5)